දිනමිණ සිළුමිණ The Silumina epaper

# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2023.10.16 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය

**සුදුසුකම්**

1. අ.පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය එකවර පහත විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව සමත් වී තිබිය යුතුයි.
   - i සිංහල භාෂාව / දෙමළ භාෂාව
   - ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   - iii. ගණිතය

**සහ**

2. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් එකවර සමත්ව තිබිය යුතුයි. (සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර) පහත සඳහන් සුදුසුකම් ඇති අයවලුන් සඳහා වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.
   - (අ) පිළිගත් ආයතනයකින් මාස හයක් (6) කට නොඅඩු කාල සීමාවක පරිගණක යෙදවුම් පිළිබඳව පිළිගත් සුදුසුකම් ලබා තිබීම.

**සහ**

   - (ආ) පරිගණක යෙදවුම් පැකේජ භාවිතය පිළිබඳව වසර 02ක පළපුරුද්ද ලබා තිබීම.

**තනතුර සඳහා වූ විශේෂ සුදුසුකම්**

ඉහත සඳහන් සුදුසුකම් වලට අමතරව සීමිත හා විවෘත කාණ්ඩ යටතේ අයදුම්කරුවන් පහත සඳහන් විශේෂිත සුදුසුකම් ලබා තිබිය යුතුයි.

- (අ) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / තාක්ෂණ විද්‍යාලයේ ගිණුම්කරණ කාර්මික ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් වෙනත් සමාන සුදුසුකමක්

**හෝ**

- (ආ) වාණිජ්‍යය විෂය ධාරාවෙන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් වී තිබීම.

**යෝග්‍යතාවය**

- (අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.
- (ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුයි.
- (ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

**තෝරා ගැනීම**

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් (වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 12/2018 බලන්න.)

වැටුප් පරිමාණය - U-MN 1 (III) රු. 30,725-17X300-35,825p.m.

**ප්‍රතිලාභ**

- ■ වැටුප්වලට අමතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.
- ■ විශ්වවිද්‍යාල සේවයට බඳවාගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබේ. (අර්ථ සාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්ව විද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

**අයදුම්පත්**

i. සෙ.මී. 23x10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇලවූ ලියුම් කවරයක් සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙත 2023.10.03 දින හෝ ඊට පෙර එවීමෙන් තනතුරට අදාළ අයදුම්පත් හා විස්තර ලබාගත හැකි අතර, www.busl.ac.lk වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැකිය.

**අයදුම් කරන පිළිවෙළ**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග ඊට අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරී (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර** යන ලිපිනයට 2023.10.16 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ii. විශ්වවිද්‍යාල / රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

iii. නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. සුදුසුකම්ලත් අපේක්ෂකයින් පමණක් කෙටි ලැයිස්තු ගතකර ලිඛිත විභාගය සහ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

**ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
**2023.09.20**